ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

**ඉන්දු-ලංකා වාණිජ මණ්ඩලයේ 11 වන වාර්ෂික මහ සභාව කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී**

ඉන්දු-ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ 11 වන වාර්ෂික මහ සභාව අද දින (2019 අගෝස්තු 2) කොළඹ, ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්විණ. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා සහභාගී විය. ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් රැසක්ද මෙම අවස්ථාවට එක් විය.

මෙම අවස්ථාවේ අදහස් දැක්වූ මහ කොමසාරිස්තුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශවීය සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සඳහා ඉන්දු-ලංකා වාණිජ මණ්ඩලය දක්වන දායකත්වය අගය කළේය. ඉන්දියාවේ විදේශ ප්‍රතිපත්තියේ මූලිකාංගය වන “සැවොම එක්ව විශ්වාසයෙන් සංවර්ධනය කරා” යන්න ඉන්දියාවට පමණක් නොව විශේෂයෙන්ම අසල්වැසි රාජ්‍යයන්ද ඇතුළු සමස්ත ලෝකය කෙරෙහිම ඉන්දියාවේ ආකල්පය බව අවධාරණය කළේය. ශ්‍රී ලන්කන් ගුවන් සේවය ඉන්දියාව වෙත වැඩි වශයෙන්ම මගීන් ගෙනයන ගුවන් සේවය වන්නේද, කොළඹ වරායෙන් 80%ක පමණ බහාලුම් මෙහෙයුම් ඉන්දියාව හා සම්බන්ධ වන්නේද, ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් වැඩිම පිරිසක් ඉන්දියානුවන් වන්නේද ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අසල්වැසි රාජ්‍යයන් වීම නිසා පමණක් නොව ශ්‍රී ලංකාව සුවිශේෂී තත්වයක් අත්පත් කරගැනීමට සමත්ව ඇති නිසා බව එතුමා ස දහන් කළේය.

ඉන්දු-ලංකා වාණිජ මණ්ඩලයේ සභාපති රොමේෂ් ඩේවිඩ් මහතා අදහස් දක්වමින් ප්‍රකාශ කළේ දෙරට අතර කර්මාන්ත අංශයන්හි සක්‍රීය ක්‍රියාකාරීත්වයක් පවතින බවයි. ඉන්දු-ලංකා වාණිජ මණ්ඩලය ද්විපාර්ශවීය ආර්ථික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා ක්‍රියා කරන බව පෙන්වා දුන්නේය. 2019 ජනවාරි මාසයේදී මුම්බායි හි පැවති CII

සහයෝගීතා සමුළුව ස දහා  ඉන්දු-ලංකා වාණිජ මණ්ඩලයේ නියෝජිත පිරිසක් සහභාගී වූ බවද සභාපතිතුමා සිහිපත් කළේය.

*****

කොළඹ

2019 අගෝස්තු 02